**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**පුරප්පාඩු**

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2012.03.15 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

## <u>සමාජීය විද්‍යා පීඨය</u>

**01. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1,

**සංවර්ධන අධ්‍යයන විෂයය සහ භූගෝල විද්‍යාව ( සමාජ-ආර්ථික අංශ කෙරෙහි විශේෂ අවධානයක් සහිතව) හදාරා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය හිමිවේ.**

**02. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1,

**පුස්තකාල හා විඥාපන විද්‍යාවට අදාළ පුස්තකාල ස්වයංක්‍රියකරණය සහ පුස්තකාල කළමනාකරණ මෘදුකාංග භාවිතය, වෙබ් අඩවි නිර්මාණය සහ වෙබ් යෙදුම්, අනථ්‍ය පුස්තකාල, පරිගණක දෘඩාංග සවිකිරීම, විඥාපන සාක්ෂරතාව, ප්‍රලේඛණ කාර්ය හා අනුක්‍රමනිකරණය සහ විඥාපන සමුද්ධරණය පිළිබඳ ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට ප්‍රමුකත්වයක් දක්වනු ලැබේ.**

**03. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය**

විඥාපක මහාචාර්ය

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

**විෂය ක්ෂේත්‍ර : ජාත්‍යන්තර අධ්‍යයනය, සමාජ සංඛ්‍යානය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව**

**04. පුරාවිද්‍යා අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

**පුරාවිද්‍යාව සහ සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.**

## <u>වෛද්‍ය පීඨය</u>

**1. කායිකවිද්‍යා අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

**2. කායව්‍යවච්ඡේද අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

* ***otorhinolaryngology*** පිළිබඳ පුහුණුවක් ලබා ඇති හෝ පුහුණුව ලබමින් සිටින අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.

3. **වෛද්‍ය අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

*** gastroenterology** *'සහ* ***hepatology*** පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.

4. **ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

*** hepatobiliary Surgery** *සහ* ***live donor liver transplantation*** පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.

5. **ළමාරෝග අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

6. **ආබාධිතතා අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1
කථන හා භාෂා චිකිත්සාව ( Speech and Language Therapy)

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1 (Audiology )

7. **වෛද්‍ය අධ්‍යයන ඒකකය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

8. **පරිඝණක ඒකකය**

කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11/ 1

*** bioinformatics*** පිළිබඳ පුහුණුව ලබා ඇති හෝ පුහුණුව ලබමින් සිටින වෛද්‍ය උපාධිධාරීන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවේ.

**වැටුප් පරිමාණය** :

| | |
|---|---|
| 1. මහාචාර්ය | රු. 50,905 - 7 x 850 - 56,855p.m. *(U-AC 5 (II))* |
| 2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 | රු. 42,650 - 7x 800 - 48,250 p.m. (*U-AC 3 (I)*) |
| 3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | රු. 37,650 - 6x 700 - 41,850 p.m. (*U-AC 3 (II)*) |
| 4. කථිකාචාර්ය (ආධුනික) | රු. 26,900 -10x585 - 32,750 p.m. (*U-AC 3 (IV)*) |

ඉහත අංක 1 සිට 3 දක්වාවූ තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 961 විධිවිධාන පරිදි වැටුපට අමතරව පහත සඳහන් පරිදි අධ්‍යයන දීමනාවක් ද ගෙවනු ලැබේ.

මහාචාර්ය තනතුරු සඳහා වැටුපෙන් 66%
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා වැටුපෙන් 64%
කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා වැටුපෙන් 39.75%

**සප්ත වාර්ෂික නිවාඩු:**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 හෝ ඉන් ඉහළ තනතුරු දරන්නන් හා ප්‍රධාන වෛද්‍ය නිලධාරී තනතුර සඳහා එක් අවුරුදු වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු හෝ අවුරුදු දෙකක වැටුප් රහිත නිවාඩු සඳහා වසර හතක සේවා කාලය අවසානයේ සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගත කරන විට ඒ සඳහා යාන පත්‍ර ගාස්තු ලැබීමේ හිමිකම අයදුම්කරුට මෙන්ම කලත්‍රයාට ද හිමිවේ.

**ප්‍රතිලාභ:**

මාසික වැටුපෙන් 10% ක් අර්ථසාධක අරමුදලට බැර වන අතර, විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ලබන 15% ක මුදලින් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. තව ද මාසික වැටුපෙන් 3% කට සමාන මුදලක් සේවා නියුක්ති භාරකාර අරමුදලට විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ලැබේ.

**අයදුම් කරන පිළිවෙල -**

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී/ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ www.kln.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍යනම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී 23x10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. **අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම** අයදුම්පත් යොමුකළ යුතු අතර අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2012.03.15 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය
2012.02.21